**ලංසුකරුවන් සඳහා උපදෙස්**

1. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2025 මැයි 20 වන දින පෙ.ව 10.30 ට පෙර කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන්ම සිදු කළ යුතුය. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ කර්මාන්තයේ නම ලියුම් කවරයේ වම්පස සටහන් කළ යුතුය.
2. ලංසුව ඉදිරිපත් කරන විට ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල මිල ගණන් කැඳවීමේ දැන්වීමේ පරිදි වීරකැටිය ප්‍රාදේශීය සභාව වෙත මුදලින් තැන්පත් කර එම ලදුපතෙහි පිටපතක් ලංසු අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය. සාර්ථක ලංසුකරු තෝරාගෙන ගිවිසුම් අත්සන් කරන තෙක් ලංසු සුරක්ෂණය නිදහස් නොකරනු ලබයි.
3. අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වීරකැටිය ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් තෝරාගන්නා ලද සාර්ථක ලංසුකරු තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් ඇගයීමෙන් පසු වීරකැටිය ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. එම ගිවිසුමට එළඹීමට ප්‍රථම සාර්ථක ලංසුකරු ගිවිසුම්ගත මුදලින් 5% කට සමාන මුදලක් ගිවිසුම් ඇප තැන්පත් ලෙස වීරකැටිය ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීම හෝ බැංකු ඇපකරයක් (මාස 12 කට වලංගු විය යුතුය) ඉදිරිපත් කිරීම කළ යුතුය. (ගිවිසුම අත්සන් කළ දින සිට)
4. ගිවිසුම් ගත වීමෙන් පසු දින 07 ක් ඇතුළත කර්මාන්තයේ වැඩ ආරම්භ කළ යුතුය.
5. මිල විචල්‍යතාවයන් සලකනු නොලැබේ.
6. වැඩ ආරම්භ කර ක්‍රියාත්මක කිරීමේදී වැඩබිම වීරකැටිය ප්‍රාදේශීය සභා තාක්ෂණ සේවා නිළධාරීවරයාගේ උපදෙස් හා අධීක්ෂණය අනුව ඉටු කළ යුතුය.
7. වැඩබිම සඳහා යොදවා ගන්නා සේවකයන්ගේ වැටුප් දීමනා ගෙවීම ඇතුළුව සේවක රක්ෂණය ද ඔබ සතු වේ.
8. වැඩබිමේ අමුද්‍රව්‍ය සඳහා රක්ෂණාවරණයද එහි සියළු වගකීම් ද ඔබ සතුවේ.
9. ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ ඉදිරිපත් කරනු ලබන බිල්පත සඳහා පමණී.
10. නඩත්තු කාලය වැඩ බිම නිම කර භාරදීමෙන් පසු මාස 06 ක කාල සීමාවක් වේ. මාස 6 කින් පසු තාක්ෂණික සේවා නිලධාරී ඇගයීම් වාර්තාව මත රැඳවුම් මුදල් නිදහස් කරනු ලැබේ.
11. වැඩ බිමේ ලොග් සටහන් තැබිය හැකි පරිදි ලේඛන පවත්වා ගත යුතුවේ.

ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති
වීරකැටිය ප්‍රාදේශීය සභාව

# කොන්දේසි සහ උපදෙස්

01. ලංසුපත් ඉදිරිපත් කළ යුතු වන්නේ ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව වන රු.45000.00 මුදල හා ආපසු නොගෙවනු ලබන පෝරම ගාස්තු වන රු.2000.00 ක මුදල වීරකැටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවා ලබා ගත හැකි ආකෘති පත්‍රය මගින් පමණි.

02. ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ 2025 අප්‍රේල් මස 29 දින සිට 2025 මැයි මස 19 වන දින තෙක් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වේ.

03. ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට ප්‍රථම ඉල්ලුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා වලංගු හැඳුනුම්පත හා ඉක්ටාඞ් ආයතනයේ ලියාපදිංචි සහතිකය ද ඉදිරිපත් කළ යුතු වේ. මීට පෙර රාජ්‍ය ආයතනයකට හෝ වෙනත් පළාත් පාලන ආයතනයකට අයවිය යුතු බදු හා දඩ මුදල් හිඟ තබා ඇති හෝ ටෙන්ඩර් කොන්දේසි කඩකර ඇති හෝ කිසිවෙකුට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු නොලැබේ.

04. ලංසුපත් සම්බන්ධව වැඩි විස්තර 2025 අප්‍රේල් මස 29 වන දින සිට 2025 මැයි 19 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාව තුළ වීරකැටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ 047-2246375 යන දුරකථන අංකයට ඇමතීමෙන් ලබා ගත හැකිය.

05. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් වෙන වෙනම ලිපි කවර වල බහා ඒවායේ මුද්‍රා තබා මුල් හා අනු පිටපත් යනුවෙන් සඳහන් කර එම ලිපි කවර නැවත එක් ලිපි කවරයක බහා මුද්‍රා තබා වම් පස ඉහළ කෙළවරේ "වීරකැටිය ප්‍රාදේශීය සභාව සතු වලස්මුල්ල වාණිජ ගොඩනැගිල්ල වීදුරු යොදා සකස් කිරීම" ලෙස සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්වල යම් වෙනසක්, මකා දැමීමක් ඇතොත් ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින් ඒවා තම කෙටි අත්සන තබා සහතික කර තිබිය යුතුය.

06. සියළුම ටෙන්ඩර්පත් 2025.05.20 දින පෙ.ව. 10.30 ට ප්‍රථම ලැබෙන සේ ලේකම්, වීරකැටිය ප්‍රාදේශීය සභාව, වීරකැටිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ.

07. ලංසුපත් විවෘත කරන අවස්ථාවේදී ලංසුව ඉදිරිපත් කරන්නාට හෝ බලය පවරන ලද නියෝජිතයෙකුට නිරීක්ෂණය මට්ටමින් සහභාගී වීමට අවසර ලැබේ. නියෝජිතයකු සහභාගී වන්නේ නම් ලංසුකරු විසින් බලය පවරනු ලැබූ ලිපියක් රැගෙන ඒම අනිවාර්ය වේ. අසම්පූර්ණ හා අවශ්‍යතා සපුරා නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. 2025.05.20 දින පෙ.ව. 10.35 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, ඉදිරිපත් කර ඇති ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් වීරකැටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

දිනය-....................................

............................................

ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති

**DEPARTMENT OF LOCAL GOVERNMENT-SOURTHERN PROVINCE**

**PRADHESHIYA SABHAWA - WEERAKETIYA**

***Walasmulla Commercial Building (Whole Sale Area Patrition)***

**Provisions of the …………………………..** **2025**

| Sub No | Item Code | Description | Quantity | Unit | Unit Price | Amount |
|---|---|---|---|---|---|---|
| 1 | Tg- 01 | 12mm clear float tempered glass approved quality partition in ss u channel (304) including 37mm x 25mm top bar and 25mm x 25mm side and bottom bar with necessary 37mm s/s screws (csk head) 600mm c/c, rawl plug , mac rod (8mm) and binding sealer...etc.ss bar304. | 135.00 | m2 | | |
| 2 | Tg- 02 | 12mm clear float tempered glass door,consisting with floor hinges (vvp) 2 yr warranty, Door handle (pair), door lock and necessary accessories and riverts , screws… etc Rate to include for making flat shape as outer line.vvp or eqallent | 22.65 | m2 | | |
| 3 | | Air Conditioning | 1 | Item | | |
| | | | | | | |
| | | | | | | |

**Total Amount (Rs)**